(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(16).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 ජූනි 09 සිකුරාදා**

---

**2023 ජූනි 20 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 20 දිනැති අංක 2324/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.06.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.03.21 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව (2020), — 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ අංක 14(3) වගන්තිය යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2019),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2020),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනත යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020/2021),— 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ පනත යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද, 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.04.25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2023 ජූනි 23 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

860/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ —

(i) රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව;

(ii) තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 මරණ සංඛ්‍යාව;

(iii) එම මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 —

(i) මෘතදේහ බැහැර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද/ ක්‍රමවේදය කවරේද;

(ii) ආදාහනය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද ;

(iii) භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද;

(iv) වයස, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව ආදාහනය කරන ලද සහ භූමදානය කරන ලද මෘතදේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ජූනි 23 සිකුරාදා)**

3332/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දංකොටුව බෞද්ධ මධ්‍යස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම බෞද්ධ මධ්‍යස්ථානය ආරම්භ කරන ලද අවස්ථාවේ, එහි විහාරාධිපති ස්වාමීන් වහන්සේ කවුරුන්ද;

(iii) ඉහත බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකර ඇති ඉඩම, ඒ සඳහා ලබා දී ඇති දිනය කවරේද;

(iv) එම ඉඩම ලබා දී ඇති ක්‍රමවේදය කවරේද;

(v) එම බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීමට පෙර එම ඉඩමේ හිමිකරු කවුරුන්ද;

(vi) එම ඉඩමේ වර්තමාන හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූලි 04 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

869/2023

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මේ වනවිට වකුගඩු දීමනාව ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් වකුගඩු රෝගීන්ගේ සුබසාධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1306/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''ගැමි සැරිය'' වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බස් රථය ධාවනය කරනු ලබන ගමන් මාර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල ජීවත්වන ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මගින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස අවුරුදු 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාතිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1323/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලග්ගල නව නගරයේ නව ප්‍රාදේශීය රෝහලක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම රෝහල ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම රෝහලේ ප්‍රසූතිකාගාරයක් හා වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණ ඒකකයක් නොමැති බව දන්නේද;

(iv) රෝහලේ මේ වනවිට පවතින අඩුපාඩු සම්පූර්ණ කර, එය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1325/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම දිස්ත්‍රික්කයේ සවිබලගන්වන ලද සමෘද්ධි සහානාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සමෘද්ධි සහානාධාරය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලුම කර ඇති පවුල් විශාල සංඛ්‍යාවක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින බව දන්නේද;

(iv) එම පවුල් සඳහා සමෘද්ධි සහානාධාරය ලබා දීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1461/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙරළ කලාප මැනුම් කටයුතු අවසන් කර තිබේද;

(ii) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති පෞද්ගලික අංශය වෙත පවරා තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති සිදු කරනු ලබන ස්ථාන කවරේද;

(iii) එම ව්‍යාපෘති පෞද්ගලික අංශය වෙත පැවරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1506/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් ලබා දෙනු ලබන සේවාවන් පුළුල් කර තිබේද;

(ii) එම සේවා ලබා ගැනීම සඳහා පහසු ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සේවයේ යෙදී සිටියදී අනතුරුවලට මුහුණපාන සේවකයන් වෙනුවෙන් මිලියන දෙකක් වන්දි ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට එම වැඩසටහන යටතේ වන්දි ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1543/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වනාන්තරවල විශාලත්වය හෙක්ටයාරවලින් කොපමණද;

(ii) එම වනාන්තර පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම වනාන්තරවල තිබෙන වෘක්ෂලතා කවරේද;

(iv) එම වනාන්තරවල ඇති ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ ශාක වර්ග කවරේද;

(v) ඒවා සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1714/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අවශ්‍යතාවය හා නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බඩඉරිඟු ආනයනය කර තිබේ නම්, ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය හා ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව බඩඉරිඟුවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2879/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2023 වර්ෂය සඳහා එම සංස්ථාව ප්‍රසාද දීමනා ගෙවා ඇති බව දන්නේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් සේවා ඛණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මහා භාණ්ඩාගාරයේ උපදෙස් නොතකා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනාධිකාරිය විසින් ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 ජූලි 05 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1579/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති බලපත්‍ර සහිත නීත්‍යානුකූල මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මත්පැන් බලපත්‍ර සහිත නීත්‍යානුකූල අවන්හල් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට නිකුත් කර ඇති මත්පැන් බලපත්‍රවලින් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

(iv) ඉදිරියේදී නිකුත් කිරීමට නියමිත නව මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශය විසින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ යටතේ වගකීම් පැවරෙන ආයතන හඳුනාගෙන ඇති බවත්;

(ii) එසේ වුවද, 2022 වර්ෂය වන තෙක් එයට අදාළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් මේ වනවිට සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාකාරී සැලස්ම කවරේද;

(iii) නොඑසේ නම්, එය සකස් කරනු ලබන දිනය කවරේද;

(iv) ඉහත ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, එම ගැටලු විසඳා ගැනීම සඳහා සකස් කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් වාර්ෂිකව ප්‍රතිලාභ ලබා ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනය මඟින් ප්‍රතිලාභ ලබා දෙන අනතුරු සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කර තිබේද;

(iii) එම ආයතනයෙන් ලබා දෙන ප්‍රතිලාභ තවදුරටත් වැඩි කිරීම සඳහා හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ආයතනය වඩාත් ජනතා හිතවාදී ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1678/2023

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන දිරිගැන්වීම සඳහා වී, බඩඉරිඟු, මිරිස්, ලොකු ලූනු, සෝයා සහ අර්තාපල් යන බෝග සඳහා නොමිලේ රක්ෂණ ආවරණයක් ලබා දෙන අතර ආපදා තත්ත්වයන් හේතුවෙන් එම බෝග විනාශ වන අවස්ථාවලදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රක්ෂණ වන්දි ලබා දෙනු ලබන බවත්;

(ii) එහෙත්, උඳු සහ රට කජු වැනි බෝග සඳහා එලෙස රක්ෂණ ආවරණයක් ලබා නොදීම හේතුවෙන් එම බෝග වගා කරනු ලබන ගොවීන් ආපදා තත්ත්වවලදී දැඩි දුෂ්කරතාවයකට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, උඳු සහ රට කජු වගා සඳහා නොමිලේ රක්ෂණ ආවරණයක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1759/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු හා මධ්‍ය පරිමාණ සත්ත්ව ගොවිපළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට පුළුල් කර ඇති ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිපළ පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1802/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වැවේ නම සහ ජල ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් වැව් අතරින් 2023 වර්ෂයේදී පිළිසකර කිරීමට සැලසුම් කර ඇති වැව් කවරේද;

(iv) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1813/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති කළුගල් කැඩීමේ වැඩබිම් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2020 සිට මේ දක්වා එම වැඩබිම් සඳහා නිකුත් කර ඇති පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(iii) එම පුපුරණ ද්‍රව්‍ය අස්ථානගත වී ඇති බව විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති බව දන්නේද;

(iv) එම තත්ත්වය ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව පිළිගන්නේද;

(v) කළුගල් කැඩීමේ වැඩබිම් සඳහා නිකුත් කරනු ලබන පුපුරණ ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2531/2023

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලි වැට ඉදිකර තිබෙන ප්‍රදේශ කවරේද;

(iv) එම අලි වැටවල මුළු දිග කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලි වැට ඉදිකර නොමැති ප්‍රදේශ;

(ii) එම ප්‍රදේශවල අලිවැට ඉදිකිරීම සඳහා ගනු ලබන පියවර;

(iii) මේ වනවිට ඉදිකර ඇති අලි වැට තවදුරටත් දීර්ඝ කිරීමට ගෙන ඇති පියවර;

කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූලි 06 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2574/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික දියර කිරි අවශ්‍යතාවය කොපමණද;

(iii) කිරි ගවයන් සඳහා වෙන් කර ඇති තණබිම් ප්‍රමාණය කොපමණද;

(iv) එම තණබිම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(v) ශ්‍රී ලංකාවේ දියර කිරි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා කිරි ගවයන් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2622/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2690/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රමිතියෙන් උසස් බීජ සපයා ගැනීම, කෘෂිකර්මාන්තයේ නිරත වී සිටින ගොවීන්ට ඇති ප්‍රධාන ගැටලුවක් බවත්;

(ii) වෙළඳපොළ තුළ අධික මිල ගණන්වලට බීජ අලෙවි කරනු ලබන බවත්;

(iii) එම බීජ ප්‍රමිතියෙන් තොර බවත්;

(iv) ඒ හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවයන්ට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගොවීන්ට ප්‍රමිතියෙන් උසස් බීජ ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ගොවීන්ට අවශ්‍ය බීජ රජයේ අනුග්‍රහය යටතේ ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) බීජ සඳහා පාලන මිලක් නියම කිරීමට පියවර ගන්නේද;

(iv) ශ්‍රී ලංකාවට අවශ්‍ය බීජ ප්‍රමාණය මෙරට තුළම නිෂ්පාදනය කර අඩු මිලට ගොවීන්ට ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) ගොවිජන සේවා මධ්‍යස්ථාන, ප්‍රාදේශීය බීජ ගබඩා මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2842/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කම්මල්කාර වෘත්තියේ යෙදී සිටින පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඔවුන් විසින් දැඩි දුෂ්කරතා මධ්‍යයේ කර්මාන්තය පවත්වාගෙන යමින් විවිධ වූ නිෂ්පාදන සිදු කරනු ලබන බව දන්නේද;

(iii) කම්මල්කරුවන්ගේ නිෂ්පාදන දේශීය වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ආනයනික කෘෂි මෙවලම් අධෛර්යමත් කිරීමෙන් කම්මල් කර්මාන්තය ආරක්ෂා කරගත හැකි බව දන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2932/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකය ස්ථාපනය කරන ලද දිනය හා ඉවත් කරන ලද දිනය කවරේද;

(ii) එම ඒකකය ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(iii) විදේශ රැකියා ක්ෂේත්‍රයේ අල්ලස, වංචාව හා දූෂණය ඉහළ ගොස් ඇති පසුබිමක ඉහත සඳහන් පොලිස් ඒකකය ඉවත් කිරීම, නීත්‍යානුකූල හා තාර්කික පදනමකින් තොරව ගනු ලැබූ තීරණයක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම පොලිස් ඒකකය නැවත ස්ථාපිත කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2969/2023

ගරු හේෂා විතානගේ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ප්ලාස්ටික් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට ප්ලාස්ටික් ආනයනය කිරීම සීමා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3074/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ —

(i) සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්ථිර සහ කොන්ත්‍රාත්/අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොන්ත්‍රාත්/අනියම් පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3093/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "පේරලන්ද" නමින් වැවක් තිබෙන බවත්;

(ii) එම වැව සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) මේ වනවිට එම ව්‍යාපෘතිය අතරමග නවතා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3106/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතෙහි පිහිටා ඇති වැව් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වාරි කටයුතු සඳහා භාවිතා කරන සහ නොකරන වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iii) එම වැව්වල ජල ධාරිතාවය වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නෙඩුන්තීවු දූපතෙහි පිහිටා ඇති වැව් අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කර ඇති වැව්වල නම් කවරේද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනවිට ප්‍රතිසංස්කරණය නොකරන ලද වැව්, ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම දූපතෙහි පවතින පානීය ජල ගැටලුවට විසඳුමක් වශයෙන් දූපතේ පිහිටා ඇති වැව් මඟින් පානීය ජලය ලබා ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3171/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුද්‍රණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන කඩදාසි ඇතුළු උපකරණවල මිල අධික ලෙස ඉහළ යාම, මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර අකර්මන්‍ය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට දැඩි අහිතකර බලපෑමක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය පාලනය කිරීම සඳහා ලබා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ වනවිට රජය සහ පෞද්ගලික අංශය විසින් මාසිකව නිෂ්පාදනය කරනු ලබන කඩදාසි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කඩදාසි ආනයනය අවම කර මෙරට කඩදාසි නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලා ආරම්භ කිරීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 ජූලි 07 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන්තොටුපළක්, ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස ශ්‍රේණිගත කිරීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(ii) පසුගිය "යහපාලන රජය" සමයේදී මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වී ගබඩා කිරීම සඳහා භාවිතා කරන ලද බව දන්නේද;

(iii) එම වී ගබඩා කිරීම සඳහා වූ තීරණය ගැනීමට මුල් වූ දේශපාලනඥයන්ගේ හා නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම තීරණය හේතුවෙන් ඉහත ගුවන්තොටුපළ පරිශ්‍රයට හා එම ගුවන්තොටුපළේ කීර්තිනාමයට දැඩි හානියක් සිදු වූ බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

384/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වික්ටෝරියා ජලාශයේ උපරිම ජල ධාරිතාවය 2021 වර්ෂය වනවිට ඝන මීටර් මිලියන 723 ක් වූ අතර 2022 ජනවාරි මාසය අවසන් වනවිට එය ඝන මීටර් මිලියන 428 ක් දක්වා පහත වැටී ඇති බවත්;

(ii) එම ජලාශයේ ජලය සීඝ්‍රයෙන් අඩුවීමට මහවැලි ගඟ මධ්‍යයේ ඇති පැල්මක් හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහවැලි ගඟේ ජල ධාරිතාවය සීඝ්‍රයෙන් පහළ බැසීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නේද;

(ii) ජලාශ මට්ටමින් වාර්ෂික ජල විගණනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදුලිය නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් ජලය ලබා ගැනීමෙන් ගංගාවල ජලය අඩුවීම හේතුවෙන් ගොවිතැන් සඳහා අවශ්‍ය ජලය නිසිකලට ලබා ගැනීම ඉදිරියේදී ගැටලුකාරී විය හැකි බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

421/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විසින් 2018 සහ 2021 වර්ෂවලදී ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විසින් ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය, වෙනත් වර්ෂවලට සාපේක්ෂව 2021 වර්ෂයේදී අඩුවීම සඳහා ඇමරිකානු ඩොලරයක් වෙනුවෙන් විවෘත වෙළඳපොළ හුවමාරු අගයට වඩා අඩු වටිනාකමක් වාණිජ බැංකු විසින් ලබා දීම හේතු වූ බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

433/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රේමා දාබරේ මහත්මිය විසින් රචනා කරන ලද සහ වීරසේන ගුණතිලක මහතා විසින් ගායනා කරන ලද "කොබෙයියනේ වරෙල්ලා" ගීතය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගුවන් විදුලි නාලිකාවල ප්‍රචාරය කිරීම වාරණය කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) එම වාරණය පැනවීමට පෙර ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණය සිදු කරන ලද්දේ කවුරුන් විසින්ද;

(v) ඉහත ගීතය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නාලිකාවක අවසන්වරට ප්‍රචාරය කරන ලද දිනය හා වේලාව කවරේද;

(vi) ඉදිරියේදී එම වාරණය ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

691/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කලවන්චිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුදාවලෙයි ප්‍රදේශයේ පසුගිය "යහපාලන" රජය සමයේදී වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකරන ලද බවත්;

(ii) මේ දක්වා ඉහත වෙළඳ මධ්‍යස්ථානය විවෘත කිරීමට පියවර ගෙන නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළඳ මධ්‍යස්ථානය මේ දක්වා විවෘත නොකිරීමට හේතු කවරේද;

(ii) එම වෙළඳ මධ්‍යස්ථානය විවෘත කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම වෙළඳ මධ්‍යස්ථානය විවෘත කරනු ලබන දිනය කවරේද;

(iv) ඉහත වෙළඳ මධ්‍යස්ථානය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා වැඩසටහනක් සකස් කර තිබේද;

(v) එසේ නම්, එම වැඩසටහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

817/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන සංඛ්‍යාව හා පොලිස් අධිකාරි කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරනු ලබන පොලිස් නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම සංඛ්‍යාව, පොලිස්පති සිට පොලිස් කොස්තාපල් රියදුරු දක්වා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) ඉහත එක් එක් තනතුර දරන කාන්තා නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රභූ ආරක්ෂක සේවයේ යොදවා ඇති මුළු පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් අමාත්‍යවරුන්ගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන වෙනත් ප්‍රභූවරුන් කාණ්ඩ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3229/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, "වෙල්ලමන්කරය" ධීවර වරාය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම වරායේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම දිනයේ සිට මේ දක්වා උපයන ලද ආදායම සහ දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙල්ලමන්කරය ධීවර වරාය සම්බන්ධයෙන් පරිසර වාර්තාවක් සකස් කර තිබේද;

(ii) එම පරිසර වාර්තාව සකස් කරන ලද නිලධාරීන්ගේ සහ අනුමත කරන ලද නිලධාරීන්ගේ නම් හා තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පරිසර වාර්තාව සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3320/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2020 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා —

(i) ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ විභාග දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම ප්‍රතිපාදනයෙන් ඉහත සඳහන් කළ එක් එක් ආයතනය සඳහා නිකුත් කර ඇති මුදල කොපමණද;

(iii) ඉහත සඳහන් කළ එක් එක් ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ සහ නිකුත් කළ මුදල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මේ සභාවට දන්වන්නෙහි ද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3333/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා, — මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට — (1)

(අ) (i) වර්ෂ 2008 සිට 2013 දක්වා කාලය තුළ එවකට ලංකා බැංකුවේ සභාපතිවරයා වූ ගාමිණී වික්‍රමසිංහ මහතා විසින් සිදු කරන ලද දූෂණ ක්‍රියා පිළිබඳව දන්නේද;

(ii) 2009 වර්ෂයෙන් පසු ලංකා බැංකුව විසින් ණය පොළිය කපා හරින ලද බව මිහින් ලංකා සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම සම්බන්ධයෙන් විමර්ශනය කළ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේදී අනාවරණය වූයේද;

(iii) වික්‍රමසිංහ මහතාගේ සභාපතිත්වය යටතේ ලංකා බැංකුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීම සහ තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සේවා සැපයීම සඳහා ඉන්ෆොමැටික් සමූහය වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණේද;

(iv) ඉහත සඳහන් කළ කොන්ත්‍රාත් ප්‍රදානය කරන අවස්ථාවේ වික්‍රමසිංහ මහතා ඉන්ෆොමැටික් සමූහයේ අර්ධ හිමිකාරිත්වයක් දැරුවේද;

(v) ඉන්ෆොමැටික් සමූහයේ හිමිකරුවෙකුව සිටියදී ඒ මහතා ලංකා බැංකුවේ සභාපතිවරයා ලෙස රාජකාරි ඉටු කිරීමෙන් බැඳියා පිලිගැටුමක් ඇති වූයේද;

(vi) වික්‍රමසිංහ මහතා විසින් සිදු කරන ලද ඉහත සඳහන් කළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ඇතුළු අනෙකුත් දූෂණ ක්‍රියා පිළිබඳව විමර්ශන සිදු කරන්නේද;

(vii) එම විමර්ශන තුළින් සොයාගත් කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

3334/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව, ඒවායේ නම් සහ එම එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද ;

(ii) ඉහත විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ගේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන් හා මහාචාර්යවරුන් විදේශ රටවලට සංක්‍රමණය වී තිබේද;

(ii) එසේ නම්, ඉදිරියේදී එසේ සංක්‍රමණය වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු

නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ චර්යාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ චර්යාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් ආයතන දැඩි නියාමනයකට ලක්කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ක්‍රියාකාරකම් හේතුවෙන් නාගරික හා ග්‍රාමීය සමාජය විශාල දෙදරායාමකට ලක් වී ඇති හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය හා කල්බදු ණය පහසුකම් සම්බන්ධයෙන් එකී ආයතනවල පෙළඹවීම මත ණය ලබාගත් විශාල පවුල් සංඛ්‍යාවක් මේ වනවිට දැඩි කම්පනයකට පත් වී ඇති හෙයින් ද, එම ආයතනවල පොලී අනුපාත විවිධ මට්ටම්වල පවතින හෙයින් ද, කල්බදු ණය පහසුකම් වාරික ගෙවීමට අපොහොසත්වන පුද්ගලයන් එම ආයතනවල විවිධ බලපෑම් හා ප්‍රචණ්ඩත්වයට ලක්වන හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් සපයන ආයතන දැඩි නියාමනයකට ලක් කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීම,— පාසල් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන වාර්ෂිකව දෙමව්පියන්ගෙන් අයකර ගැනීම අඛණ්ඩව සිදුවන හෙයින් ද, වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතැම් දෙමව්පියන් හට එම මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට අපහසු වීම හේතුවෙන් එකී දෙමව්පියන්ගේ දරුවන් පන්ති කාමර තුළ දී අපහසුතාවයන්ට ලක්වීමට ඉඩ ඇති හෙයින් ද, පාසල් සංවර්ධන කටයුතුවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගත යුතු ආකාරයත්, එම මූල්‍ය අයවැය වාර්තා ප්‍රදර්ශනය කළ යුතු ආකාරයත්, එකී සංවර්ධන කටයුතු සඳහා පසු විපරම් කටයුතු කළ යුතු ආකාරයත් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2023

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා,— ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— වසර ගණනාවක් එකම පාසලක් තුළ සේවය කිරීම හේතුවෙන් ගොඩනැගෙන පෞද්ගලික සබඳතා හේතුවෙන් ඇතැම් ළමුන් හට යම් යම් අවස්ථාවල දී අසාධාරණකම් ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ ස්ථරවල ළමයින් සමඟ සේවය කිරීම මඟින් ළමා මනස අවබෝධ කරගැනීමේ හැකියාව හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවන හෙයින් ද, දේශපාලන, සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ උප සංස්කෘතීන් අවබෝධ කර ගැනීමට ඇති අවස්ථා ගිලිහී යන හෙයින් ද, විවිධ ප්‍රාදේශීය භාෂාවන් සහ ප්‍රාදේශීය සංස්කෘතීන්ගෙන් අත්දැකීම් ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වන හෙයින් ද, අධ්‍යාපනය ලබාදීම සහ යහපත් සමාජ පුරවැසියකු බිහි කිරීම යන ඒකායන අරමුණ ඉටුවන අධ්‍යාපන ක්‍රමවේදයක් ඇති කිරීම උදෙසා සියලුම ගුරුවරුන් හට වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ගරු සංජීව එදිරිමාන්න මහතා,— රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකීමක් සහිත වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම,— අතීතයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යාල උපකරණ සඳහා යොදා ගනු ලැබූ දැව භාණ්ඩ දීර්ඝ කාලයක් භාවිත කළ ද වර්තමානයේ දී එම ආයතන භාවිත කරන කාර්යාල උපකරණ ප්ලයිවුඩ් ෂීට් හා අනෙකුත් කෘත්‍රිම ෂීට් වර්ග යොදා සකස් කරන හෙයින් ඉතා කෙටි කාලයකින් ඒවා විනාශ වන හෙයින් ද, මෙම වත්මන් කාර්යාල උපකරණ සකස් කිරීම සඳහා විදේශ රටවලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීම හේතුවෙන් විශාල වශයෙන් විදේශ රටවලට මුදල් ගලායාම සිදුවන හෙයින් ද, අපගේ පරිසර පද්ධතියට ඉවතලන මෙම ද්‍රව්‍යවලින් දැඩි බලපෑමක් එල්ලවන හෙයින් ද, රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකිවයුතු වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.